# බ්‍රහ්ම සංකල්පයේ ප්‍රභවය හා ව්‍යාප්තිය

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

මාතෑවේ විමලරතන හිමි

බ්‍රහ්ම සංකල්පයේ ප්‍රභවය සඳහා මූලික වශයෙන් බලපා ඇත්තේ ඒකේශ්වරවාදී අදහස්ය. ඍග්වේදයේ ඒකේශ්වර වාදයට නැඹුරු වූ අදහස් දක්නට ලැබේ. ප්‍රධාන වශයෙන් දක්නට ඇත්තේ බහුදේවවාදයකි. මෙහි අන්තරික්ෂ පෘථිවිවාසී දේවකොටස්ද වියුක්ත සංකල්ප මත පහළ වූ දේව කොටස්ද දක්නට ලැබේ. ඉන්ද්‍ර රුද්‍ර මරුත් වැනි දෙවිවරු අන්තරික්ෂවාසීන් ලෙසද අග්නි සෝම වැනි දෙවිවරු පෘථිවිවාසීන් ලෙසද ප්‍රජාපති විශ්වකර්මන් වියුක්ත සංකල්පීය දෙවිවරුන් ලෙසද සැලකෙයි. අතීතයේ සිටම ඉන්දියානුවන් අතර ඉන්ද්‍ර අග්නි වැනි බලගතු දෙවියන්ගේ පැවැත්ම පිළිබඳව සැක පහළ වන්නට විය. ස්වභාවධර්මයේ බලගතු දෙවියකු වන ඉන්ද්‍ර පිළිබඳ භක්තිය ප්‍රකාශ කරන ඉන්ද්‍ර සූක්තයේ-එම්බා ජනයෙනි හේ ඉන්ද්‍රය-යන්නෙන්ද එම සූක්තයේ අවසානයේ විශේෂ ඡේදයකින් හේ කොහේදැයි අසන්නේ කවුරු ගැනද හේ නැත ඔහු ඉන්ද්‍රය. එබැවින් ඔහු ඇදහම් යන්නෙන් ද, අවධාරණය කෙරෙන්නේ ඉන්ද්‍ර පිළිබඳ සැක පහළ කරගත් ජනයා එකල සිටි බවයි. දෙවිවරුන් අතර උසස්ම දෙවියකු වන ඉන්ද්‍ර පිළිබඳ මෙසේ කුකුස් ඇතිවීම අනිත් දෙවිවරුන් කෙරෙහි වඩ වඩාත් සැක පහළ වීමට හේතුවන්නකි. මෙහිදී කැපී පෙනෙන ලක්ෂණය නම භක්තිමතුන් තම තමන් කැමති දෙවිවරුන් ඒ ඒ අවස්ථාවල ප්‍රධානත්වයෙහි ලා සලකා බැලීමයි. මේ නිසා ප්‍රජාපති ලෝකයේ නිර්මාතෘවරයා ලෙසත් ආරක්ෂකයා හැටියටත් පැවසෙයි (ඍග්වේද × 121 සූක්ත) දේව බහුත්වය යටපත් කොට ඒකේශ්වර වාදය නැගී සිටින අයුරු මෙයින් තහවුරු වේ. නිර්මාතෘ ප්‍රජාපති පූජාර්හ වන බවත් අනිත් දෙවියන් කෙරෙහි සැක පහළ කළ යුතු අයුරුත් මෙයින් ප්‍රකාශ වේ. ප්‍රජාපතීද බොහෝ දෙනාකුගේ සැලකිල්ලට ගෞරවයට පාත්‍ර නොවිණි. වරෙක ප්‍රජාපතිද තවත් අවස්ථාවක විශ්වකර්මන්ද (ඍග්වේද × 81–82) බෘහස්පතිද නිර්මාතෘවරුන් ලෙස සලකනු ලැබෙත්. ඍග්වේදයෙහි එන.

> එකං සත් විප්‍රා බහුධා වදන්ති.
> අග්නිං යමං මාතරිස්වානමාහු : (ඍග්වේද–1–46)

යන්නෙන් කියවෙන අදහසට අනුව සියල්ල පාලනය කරන සර්වබලධාරි දෙවියකු ගැන සඳහන් වෙයි. මෙය පසුකාලයේ දියුණු වී ආ බ්‍රහ්ම සංකල්පයේ මූලික අවස්ථාව ලෙසද දැක්විය හැකිය. සියලු දෙවිවරු සහ මිනිසුන් අදිතිය යන තන්හිද ලෝකයේ සත්වයින්ගේ ආත්මය සූර්යයා යන තැනද ලොව අසත් පදර්ථයකින් බිහිවුණි යන්නෙහිද ඒකත්වය පිළිබඳ අදහසක් දක්වෙයි. මම සියල්ල වෙමි. (ඍග්වේද × 61–19 සූක්ත) යන තැනද මෙබඳු ම අදහසක් දැක්වේ. උපනිෂද් දර්ශනයේ බ්‍රහ්මන්–ආත්මන් අනන්‍යත්වයේ මූල බීජයක ස්වරූපයද දක්වයි. තවත් වැදගත් දෙයක් ලෙස පෙනෙනුයේ ඍග්වේදයේ සමහර තැන්වලදී දේව සමූහයා එක පොදු නාමයකින් හැඳින්වීමයි. මෙයද ඒකේශ්වර වාදයේ මුල් පදනම ලෙස සැලකිය හැකිය.

## බ්‍රහ්ම ශබ්දයේ අර්ථය හා එහි ස්වරූපය

ඍග්වේදයේ බ්‍රහ්ම යන්නට දිව්‍යමය ස්වරූපයක් නොලැබුණි. මෙය යඥය, සූක්ත, මන්ත්‍ර, යන අර්ථ සඳහා යෙදී තිබේ. බ්‍රහ්ම යන්න සාමාන්‍ය අර්ථයක් සඳහා යොදු ගත්තද ක්‍රමයෙන් මෙහි බලයද අගයද වැඩි විය. ඉන්ද්‍ර සූක්තයේ වේද ගීතිකා යන අරුත දීම උදෙසා මෙය යොදගෙන ඇත. (ඍග්වේද 1–12–14) ක්‍රමයෙන් මෙය විකාශයට පත්ව යාගයෙන් ලැබෙන "ඵලය" බ්‍රහ්ම ලෙසින් හඳුන්වන ලදී. පසු කාලයක බ්‍රහ්ම යාගයේ බලය ලෙස සලකා මෙයින් විශ්වය මවන ලද බවද සඳහන් වේ. විවිධ කාර්යයන් ඉෂ්ට කර ගැනීමේ අසහාය මාර්ගය වශයෙන් යාගය වර්ධනය වූ අයුරු සාම, යජුර් යන වේද ග්‍රන්ථවලින්ද අනාවරණය වෙයි. යාගයෙන් ජීවන වෘත්තිය පවත්වාගෙන ගිය බමුණෝ යාගය විශේෂ පූජා විධියක් බවට පෙරළා බ්‍රාහ්මණ නමින් ග්‍රන්ථ සමූහයක් ඍග්වේදයට එකතු කළහ. යාගය පිළිබඳ දැනුම බ්‍රහ්මයාගෙන් ලැබුනේ යැයි සලකා මෙය ශ්‍රැති නමින්ද හැඳින්වූහ.



4—A 081356

උපනිෂද් යුගයේදී බ්‍රහ්ම සංකල්පය ක්‍රමිකව වර්ධනයට පත් විය. බ්‍රහ්ම පදාර්ථය ලෝක සත්‍යය විස්තර කිරීමට උපයෝගී කර ගැනීම නිසා මුළුලොවම මවා එහි ක්‍රියාකාරිත්වය ඇති කරන ගුප්ත බලය ලෙස මෙය පිළිගැනිණි. (බෘහදාරණ්‍යක උපනිෂද් iii—) පරම සත්‍යය අවබෝධ කර ගැනීම උදෙසා උත්සාහයක් දරූ පුතකුට පියකු විසින් කරන විස්තරය මෙහි වැදගත් තැනක් උසුලයි. කවරකුගෙන් මේ සත්වයා උපත ලැබුවේද ඉපිද කුමක් තුළ ජීවත් වන්නේද මරණින් පසු කවුරුන් තුළට පිවිසියේද ඒ බ්‍රහ්ම බව හෙතෙම පැවසීය. (තෛත්තිරීය උපනිෂද් 3 පරි–1) මෙයින් අදහස් කරන්නේ සත්වයාගේ මුල් පැවැත්ම බ්‍රහ්මයාට පැවරෙන බවයි. මෙහිදී තපස්ද බ්‍රහ්ම ලෙසින් සලකා ඇත. සදාචාරයට බරවූ දැනීම හා බුද්ධිය එකක් ලෙස සැලකෙන ආනන්දය ශ්‍රේෂ්ඨ ඵලය ලෙසින් සලකා එයද බ්‍රහ්ම ලෙසින් හඳුන්වා ඇත. බ්‍රහ්ම ස්වරූපය දක්වන ඇතැමෙක් ඉර හඳ අධිගෘහිත පුරුෂයා ලෙසද ඇතැමෙක් අවකාශය ලෙසද ඇතැමෙක් ජලය ලෙසින්ද සලකති. (ඡාන්දෝග්‍ය උපනිෂද් 5) කඨෝපනිෂදයෙහි බ්‍රහ්ම පසිඳුරන්ට ගොදුරු නොවේ. ව්‍යයවීමක් හෝ දිරීමක් නැත. පටන් ගැන්මක් හෝ අන්තයක් නැත. ස්ථිර වූ ශ්‍රේෂ්ඨ වූ මේ බ්‍රහ්ම තත්වය අවබෝධ කර ගැනීමෙන් සත්වයා මාර මුඛයෙන් මිදෙන බව එහි පැවසෙයි. මෙහිදී ලෝකය පාලනය කරන සත්වයාගේ විමුක්තිය සලසා ලන ගුප්තමය බලවේගය ලෙස බ්‍රහ්මන් හැඳින්වෙයි. (භාෂ්‍ය ඡාන්දෝග්‍යයෙහි) බ්‍රහ්ම ශබ්දය සඳහා ශූන්‍ය යන වචනය යොදා ඇත. (ඡාන්දෝග්‍ය භාෂ්‍යය 1–14) උපනිෂද්, ආත්මන් හා බ්‍රහ්මන් යන පදාර්ථ දෙක අතර දැඩි සබඳතාවක් ඇත. උපනිෂද්හි බ්‍රහ්ම යනු ආත්මය ලෙස සඳහන් වේ. (තෛත්තිරීය උපනිෂද් 1–5) මේ පදාර්ථ දෙක මුලින් වෙන්වෙන්ව තිබුනද උපනිෂද් සමයේ එකක් ලෙස සලකා ඇත. ආත්මන් යනුවෙන් අදහස් කරනු ලැබුවේ බ්‍රහ්මන් තත්වයේම එක් අවස්ථාවකි. ජගදාත්ම, ප්‍රත්‍යගාත්ම වශයෙන් ආත්මය දෙවැදෑරුම් වේ. ලෝකය පිළිබඳ පරම සත්‍යය ජගදාත්මය ලෙසද පුද්ගලයා පිළිබඳ සත්‍යය ප්‍රත්‍යගාත්මය ලෙසද සැලකිණ. ඡාන්දෝග්‍ය උපනිෂදයෙහි ආත්මය සහල් ඇටයකටත් අබ ඇටයකටත් වඩා කුඩා බවත් මෙය අවබෝධ කළ පුද්ගලයා බ්‍රහ්ම තත්වයට පත්වන බවත් සඳහන් වේ. බෘහදාරණ්‍යක උපනිෂදයෙහි බ්‍රහ්මන් ආත්මන් ගැන පවත්නා සාකච්ඡා බෙහෙවින් එයි. ගාර්ග්‍ය හා අජාසත්ගේ සාකච්ඡාව මෙහි වැදගත් වෙයි. ඔවුන් දෙදෙනා කළ කථාවේ සාරය මෙසේය. මකුළුවා තුළින් සූත්‍ර පිටවන්නා සේද ගින්නෙන් ගිනිදලු ඇතිවන්නාසේද, සියලුම ඉන්ද්‍රියෝද, ලෝකයද, සූර්යයෝද, සත්වයෝද, ආත්මය තුළින් පිටත හරිනු ලබන්නෝය. උපනිෂද් යුගයේ බ්‍රහ්මන් හා ආත්මන් එකක් ලෙස සලකා ඇත.

බ්‍රහ්මන් පිළිබඳව උපනිෂද්හි දක්වන අදහසට වඩා ශ්‍රේෂ්ඨ වූ අර්ථයක් බුද්ධ ධර්මයේ එන බ්‍රහ්මන්ගෙන් ගම්‍යමාන වේ. සර්වබලධාරී වෛදික බ්‍රහ්ම බුද්ධ ධර්මයෙන් විවේචනයට ලක් වේ. බෞද්ධ ග්‍රන්ථවල ඔහු පුද්ගල ස්වරූපයෙන්ද දේව ගණයට අයත් වූවකු ලෙසද සඳහන් වේ. මේ පදනම මත බ්‍රහ්මලෝක පිළිබඳ අදහසද ඇති විය.

මෙයින් බ්‍රහ්මපාරිසජ්ජය ඉතාම පහත් බ්‍රහ්ම ලෝකය ලෙස සැලකේ. ධ්‍යාන වැඩූ ස්ත්‍රීන් මෙහි උපදින බවට විශ්වාසයක් පවතියි. අනාගාමි ඵලය ලබාගත් අය සුද්ධාවාසයේ උපදිති. එහිදී රහත් ඵලයට පත්ව ඔව්හු පිරිනිවන් පාති. විසුද්ධිමාර්ගයේ සඳහන් වන පරිදි බ්‍රහ්මලෝක හැර ඉතිරි ලෝක විනාශ වේ. මින්පසු පෘථිවියේ පළමුව උපදින පුද්ගලයා ආභස්සර ලෝකයෙන් පැමිණේ. (විසුද්ධිමග්ග අභිඤ්ඤානිද්දෙස) බ්‍රහ්ම ලෝක දිව්‍යලෝකවලට වඩා උසස් තත්වයෙන් පවතින බව මෙයින් හැඟී යයි. ධ්‍යාන වැඩූ පුද්ගලයෝ බ්‍රහ්ම ලෝකයේ උපදිත් යැයි විසුද්ධි මග්ගයේ සඳහන් වෙයි. "ඤාණං විනා නත්ථි බ්‍රහ්මලෝකෙ උප්පත්ති". බුද්ධධර්මයේ දැක්වෙන පුද්ගල බ්‍රහ්මත්වය ආගමික මෙන්ම සදාචාරාත්මක අතින්ද වැදගත් තමක් උසුලයි. සමාජ ආචාර ධර්ම පෙන්නුම් කිරීමේදී පවුලේ උසස්ම පුද්ගලයන් වන මව්පියන් බ්‍රහ්මත්වයෙන් ගෙන තිබේ. බ්‍රහ්ම යකු තුළ තිබිය යුතු ගුණධර්ම නම් සතර බ්‍රහ්ම විහරණයි. මේ ගුණධර්ම දෙමාපියන් තුළ දරුවන් උදෙසා පවතින බව සඳහන් වේ. (අංගුත්තර චතුත්ථ, වේසාරජ්ජ) මෙය ධර්ම චක්‍ර යන්නට යොදා ඇති පරියාය නාමයක් ලෙස අටුවාවෙහි සඳහන් වේ. බ්‍රහ්මචරිය යන්නද ශ්‍රේෂ්ඨ බෞද්ධ සංකල්පයෙකි. අංගුත්තර නිකාය බ්‍රහ්මචරිය සූත්‍රයෙහි

සංවරත්ථං පහානත්ථං—බ්‍රහ්මචරියං අනීතිහං
අදෙසයි සො භගවා—නිබ්බාණොගධගාමිනං

නිර්වාණයට පමුණුවන සුලු බඹසර ක්ලේශයන්ගේ සංවරය පිණිස ප්‍රහාණය පිණිස වදළ බව සඳහන් වේ. බ්‍රහ්මචරිය වෙනත් ශ්‍රමණයන් අතර ව්‍යවහාර වූ වචනයක් උවද මෙය අර්ථවත් වූයේ බෞද්ධ සංකල්ප මතයි. සංයුත්ත නිකායේ බ්‍රහ්මයාන ශබ්දයක් ද ඇත. මෙය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට යෙදෙන අධිවචනයක් ලෙස සඳහන් වේ. බ්‍රහ්මවිහාර යන වචනයෙන් ද, මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා, යන සතර ගැණෙන අතර සතර බ්‍රහ්ම විහරණ භාවනාව ප්‍රගුණ කිරීමෙන් බ්‍රහ්ම ලෝකවල උත්පත්තිය ලබන බව ද තෙවිජ්ජක සූත්‍රයෙන් පැහැදිලි වේ.

---

" ප්‍රශ්නයන් පැන නැගෙන හැම අවස්ථාවක ම මේකට ඔවුන් යමක් කරන්නේ නැත්තේ ඇයිදැයි බලා සිටින්නා අසයි "

---